විශේෂ සටහන 12

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග: 2017[1]

### මුදල් ප්‍රතිපත්තිය

| | |
|---|---|
| 2017 මාර්තු 24 | - ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 දක්වා පදනම් අංක 25 කින් ඉහළ නංවන ලදී. |
| 2018 අප්‍රේල් 04 | - නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25 කින් සියයට 8.50 දක්වා අඩු කරන ලද අතර නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 7.25 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගන්නා ලදී. මෙම තීරණය මගින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ පරාසය පදනම් අංක 150 සිට පදනම් අංක 125 දක්වා පටු විය. |

### මූල්‍ය අංශය

#### බලපත්‍රලාභී බැංකු

| | |
|---|---|
| 2017 ජනවාරි 13 | - 2017 ජනවාරි 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම මත ණය අනුපාත අනුගමනය කරන ලෙස බැංකු පනත යටතේ 2017 අංක 01 දරන විධානය බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2017 පෙබරවාරි 01 | - 2017 අයවැය මගින් අනුමත කරන ලද පහත දැක්වෙන කරුණු පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.<br>- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, අපනයන, සංචාරක කටයුතු, කෘෂිකර්මාන්තය, තරුණ සහ කාන්තා ආදී හඳුනා ගත් අංශ වෙත ණය පහසුකම් සැපයීම<br>- බැංකු සේවා වැඩිදියුණු කිරීම |
| 2017 පෙබරවාරි 15 | - 2017 බැංකු පනත් විධාන අංක 01 හි විධාන 5 ට අදාළ ඇතැම් අර්ථ දැක්වීම් සංශෝධනය කරමින් සහ ප්‍රතිස්ථාපනය කරමින් මෝටර් රථ සම්බන්ධව ලබා දෙන ණය පහසුකම් මත පනවා ඇති වටිනාකම මත ණය අනුපාතය සඳහා බැංකු පනත යටතේ 2017 අංක 02 දරන විධානය නිකුත් කරන ලදී. |
| 2017 මාර්තු 22 | - බලපත්‍රලාභී බැංකු සඳහා 1998 සැප්තැම්බර් 07 දින නිකුත් කර තිබූ උකස් කොන්දේසි සඳහා සංශෝධන ඇතුළත් කරමින් නව විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 26 | - 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන ණය පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාතික සහ හිඟ ණය මුදල් මත අය කරන දඩ පොලී, ප්‍රමාණවත් අන්දමින් හෙළිදරව් කිරීමේ පදනම මත, අදාළ බැංකුවේ ණය ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි අයකර ගැනීමට අවසර දෙමින්, බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 29 | - මෑතකදී පැවති ගංවතුර, අයහපත් කාලගුණික තත්ත්ව සහ ඊට සම්බන්ධ සිද්ධි නිසා හානියට පත් ව්‍යාපාර හා ඒවායේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු යළි නඟාසිටුවීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ එකී හානියට පත් වූ, ණය ලබා ගත් ගනුදෙනුකරුවන් වෙත අවස්ථානුකූලව සහන ලබා දීම සඳහා සියලුම බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 31 | - 2017 බැංකු පනත් විධාන අංක 02 හි විධාන 5.1 සහ 5.4 සංශෝධනය කරමින් සහ ප්‍රතිස්ථාපනය කරමින් මෝටර් රථ සම්බන්ධව ලබා දෙන ණය පහසුකම් මත පනවා ඇති වටිනාකම මත ණය අනුපාත සඳහා බැංකු පනත යටතේ 2017 අංක 04 දරන විධානය නිකුත් කරන ලදී. |
| 2017 ඔක්තෝබර් 26 | - බලපත්‍රලාභී බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නංවමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 නොවැම්බර් 29 | - 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු සඳහා බැංකු පනත් විධානයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |

1 2017 වසර තුළ දී මෙන්ම 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ප්‍රකාශයට පත් කිරීම තෙක් 2018 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙන්ම නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද මෙයට ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| 2017 දෙසැම්බර් 12 | - | 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකු සඳහා විදේශ මුදලින් ණය ගැනීමේ නව ප්‍රතිපත්තිය දැනුම් දීම සඳහා බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී. |
| 2018 ජනවාරි 08 | - | 2018 අයවැය මගින් අනුමත කළ පරිදි, 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන ලෙස, මෝටර් වාහන ආනයනය සඳහා භාවිතික (usance) ණයවර ලිපි නිකුත් නොකරන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2018 ජනවාරි 09 | - | 2010 අංක 01 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි, 2018 අංක 01 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි මගින් සංශෝධනය කරන ලදී. |
| 2018 පෙබරවාරි 08 | - | 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත්, දෙමුහුන් සහ අනෙකුත් ලියාපදිංචි නොකළ මෝටර් රථ සහ මෙරට තුළ ලියාපදිංචි කර වසරකට නොවැඩි වාහන සඳහා ලබා දෙන ණය පහසුකම් මත පනවා ඇති වටිනාකම මත ණය අනුපාත දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත විධානයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | බාසල් III රාමුවට අදාළ තෝලන අනුපාතය හඳුන්වා දීම |
| | - | බාසල් III යටතේ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය (NSFR) හඳුන්වා දීම |
| | - | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 9 (SLFRS 9) බලපත්‍රලාභී බැංකුවල භාවිතය ඇරඹීම සඳහා මූලික මාර්ගෝපදේශ නිකුත් කිරීම |
| | - | බලපත්‍රලාභී බැංකු සඳහා නව කොටස් හිමිකාරිත්ව ප්‍රතිපත්තියක් හඳුන්වා දීම |
| | - | විදේශ සේවකයින් බලපත්‍රලාභී බැංකුවල සේවයේ යෙදවීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම |
| | - | බැංකුවල බාහිර විගණකවරුන් තෝරා පත් කර ගැනීමේ මාර්ගෝපදේශ සඳහා සංශෝධන හඳුන්වා දීම |
| | - | බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයින් පත් කිරීම සඳහා නියාමන රාමුවක් හඳුන්වා දීම |
| | - | බලපත්‍රලාභී බැංකු සඳහා ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීම |
| | - | මෑතකදී හඳුන්වා දුන් "ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළඳපොළ අධීක්ෂණ" නම් නව වාර්තාකරණ පද්ධතිය තුළ වාර්තා වන දෛනික දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ අන්තර් බැංකු ගනුදෙනුවලට අදාළව නව වාර්තාකරණ අවශ්‍යතා ඇතුළත් කාර්ය උපදේශන පටිපාටියක් නිකුත් කිරීම |
| | - | බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය කටයුතුවලට අදාළ වන ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණය මත පනවන ලද සීමා ඉහළ දැමීම |

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 13 | - | 2017 වර්ෂය සඳහා වන අයවැය අනුව යමින්, බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කර තිබූ මෝටර් වාහන වෙනුවෙන් ණය පහසුකම් ලබා දීමේදී ඒවායේ වටිනාකම් මත ලබා දෙන ණය අනුපාතය සම්බන්ධ විධාන සංශෝධනය කරන ලදී. |
| 2017 පෙබරවාරි 17 | - | 2017 ජනවාරි 13 දින නිකුත් කළ වටිනාකම් මත ණය අනුපාත විධානයෙහි වාහන වර්ග මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන වර්ගීකරණයට අනුරූප කිරීම සඳහා අවශ්‍ය සංශෝධන නිකුත් කරන ලදී. |
| 2017 පෙබරවාරි 23 | - | බලපත්‍රලාභී මුදල් සමාගම් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධනය ක්‍රමයෙන් වැඩි කිරීම සඳහා විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 30 | - | ගංවතුර, අහිතකර කාලගුණික තත්ත්ව සහ ඒ හා සම්බන්ධිත ආපදා අවස්ථාවල අහිතකර බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර හා සාමාන්‍ය මෙහෙයුම් කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා පහසුකම් සැලසීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ එවන් ගනුදෙනුකරුවන් වෙත පහත දැක්වෙන සහන ලබා දීමට බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට අවසර ලබා දෙන ලදී.<br>- සියලුම සක්‍රීය ණය පහසුකම් වෙනුවෙන් මාස තුනකට නොවැඩි පමා සහනයක් ලබා දීම |

| | | |
|---|---|---|
| | | - ඉහත පමා සහනය යටතේ වන ණය ගනුදෙනුකරුවන් සහ ඉහත සඳහන් අහිතකර බලපෑම්වලට ලක් වූ අක්‍රීය ණය ගනුදෙනුකරුවන් නැවත සැලසුම් කරන ලද කොන්දේසි යටතේ තම ව්‍යාපාර කටයුතු යළි ආරම්භ කිරීමෙන්/ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ණය පියවීම සඳහා කැමැත්තක් දක්වන්නේ නම් හිඟ ණය වෙනුවෙන් අය කරන දඩ පොලිය කපා හැරීම |
| 2017 ජූනි 02 | - | 2017 පෙබරවාරි 17 දින නිකුත් කළ වටිනාකම් මත ණය අනුපාත විධානයෙහි වාහන වර්ග මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන වර්ගීකරණයට අනුරූප කිරීම සඳහා අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී. |
| 2018 ජනවාරි 16 | - | මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 අංක 01 දරන මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ නියාමන රාමුව සම්බන්ධ විධානය නිකුත් කරන ලදී. |
| 2018 පෙබරවාරි 08 | - | 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත්, දෙමුහුන් සහ අනෙකුත් ලියාපදිංචි නොකළ මෝටර් රථ සහ මෙරට තුළ ලියාපදිංචි කර වසරකට නොවැඩි වාහන සඳහා ලබා දෙන ණය පහසුකම් මත පනවා ඇති වටිනාකම මත ණය අනුපාත දැනුම් දෙමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව ක්‍රියාත්මක කිරීම |

**රක්ෂණය**

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 01 | - | රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් රක්ෂණ අංශයේ වෘත්තීමයභාවය සහ ප්‍රතිරූපය නංවාලීමේ අරමුණින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ හිමිකම්පෑම් පිළිබඳව විමර්ශන සිදු කිරීම හා සම්බන්ධ මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 09 | - | රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් රක්ෂණ තැරැව්කාර කටයුතු හැරුණු විට වෙනත් උපයෝගී සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩල කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 අගෝස්තු 28 | - | සියලුම රක්ෂණ තැරැව්කරුවන්ට ඕනෑම වෙනත් රක්ෂණ තැරැව්කරුවකු වෙනුවෙන් අලෙවිකරණය සහ/හෝ විකුණුම් සඳහා පෙළඹවීම සහ/හෝ ඕනෑම විදේශ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් සඳහා උප තැරැව්කරුවන් ලෙස ක්‍රියා කිරීම තහනම් කරමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 ඔක්තෝබර් 19 | - | 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය නියාමන (සංශෝධන) පනත මගින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස හඳුන්වා දෙන ලදී. |
| 2017 දෙසැම්බර් 18 | - | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වරලත් රක්ෂණ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය හෝ ඒ හා සමාන අනුබද්ධ ආයතනයක සුදුසුකම්ලත්, එක් පුද්ගලයෙකු හෝ විශේෂිත නිලධාරියෙකු ලෙස යෙදවීමට සෑම රක්ෂකයෙකුටම නියෝග කරමින් විධානයක් නිකුත් කරන ලදී. |

**ප්‍රාග්ධන වෙළඳපොළ**

| | | |
|---|---|---|
| 2017 මැයි 09 | - | විදේශීය ආයතන ලැයිස්තුගත කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවෙහි බහු ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ව්‍යාපාර වස්තු දැක්වෙන පුවරුවක් ස්ථාපිත කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවේ අවසරයට යටත්ව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී. |
| 2017 ජූනි 06 | - | ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් මහජනතාවට ඒකක භාර අලෙවි කිරීමේදී යොදා ගන්නා වෙළඳ දැන්වීම් සහ ප්‍රවර්ධන මාධ්‍යවල අන්තර්ගතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| 2017 ජූනි 13 | - | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පුවරුවක් ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙන ලදී. |
| 2017 ජූනි 28 | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුකූල නොවීම් සඳහා අවම මහජන හිමිකම් අවශ්‍යතා (minimum public float) කොන්දේසි බලාත්මක කිරීමට කොළඹ කොටස් හුවමාරුවට අනුමැතිය ලබා දෙන ලදී. |

| | |
|---|---|
| 2017 අගෝස්තු 01 | - කොටස් තැරැව්කාර සමාගම්වල අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා රාමුව ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාපටිපාටියක් සඳහා එම සමාගම් යොමු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී. |
| අපේක්ෂිත | - නව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත හඳුන්වා දීම |
| | - "ආයතන පවරා ගැනීමේ ලන්ඩන් සංග්‍රහය" සඳහා යෝජිත මෑතකාලීන සංශෝධන සැලකිල්ලට ගනිමින් "නව පවරා ගැනීමේ හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය" සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම |
| | - කොළඹ කොටස් හුවමාරුවෙහි කටයුතු අසමූහිකරණය (demutualisation) කිරීම ක්‍රියාත්මක කිරීම |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය**

| | |
|---|---|
| 2017 ජනවාරි 20 | - ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමයේ දෙවන අදියර, 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීමට අදාළව මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2017 පෙබරවාරි 06 | - මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ආපසු ගෙවීම සඳහා වූ උපරිම කාලසීමාව ව්‍යාපෘතියේ ස්වභාවය මත, වසරක උපරිම සහන කාලයක් ද ඇතුළත්ව වසර 5 සිට වසර 6 දක්වා දීර්ඝ කරන ලදී. |
| 2017 පෙබරවාරි 08 | - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙනුවෙන් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය සහ රැකියා අවස්ථා ජනනය කිරීමේ අරමුණින් "ස්වශක්ති - රැකියා දස ලක්ෂයක් කරා" නමින් නව ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. |
| 2017 මාර්තු 01 | - ණය ආපසු ගෙවීමේ උපරිම කාලසීමාව අවුරුදු 4 සිට අවුරුදු 5 දක්වා ඉහළ නැංවීමටත් ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන සහ ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධන වැඩසටහන සම්පූර්ණ කර ඇති ණය ගන්නන් හට ණය ලබා ගැනීමට හැකි වන පරිදි නිර්ණායක වෙනස් කිරීම සඳහා ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - II හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2017 අප්‍රේල් 03 | - ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වීමේ කාලය 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලද අතර, අදාළ මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2017 අප්‍රේල් 26 | - ලෝක බැංකුව මගින් මූල්‍යනය කරනු ලබන කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ "ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය" ආරම්භ කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2017 ජුනි 28 | - 2017 වසරේ ආපදාවන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු නැවත නගාසිටුවීමේ අරමුණින් සහනදායී මූල්‍ය පහසුකම් ලබා දීම සඳහා ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ, "ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය" ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2017 ජූලි 11 | - "තරුණ දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත හැකි ණය ප්‍රමාණය රුපියල් 150,000 සිට රුපියල් මිලියනය දක්වා ඉහළ නැංවීමට මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2017 අගෝස්තු 02 | - "තරුණ දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ආපසු ගෙවීමේ කාලසීමාව මාස 36 සිට මාස 48 දක්වා වැඩි කිරීමට මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2017 අගෝස්තු 18 | - ආපදාවන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා සහනදායී කොන්දේසි සහ නියමයන් යටතේ මූල්‍ය පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් "අත්වැල" ණය යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. |

## ගෙවීම් හා පියවීම්

2017 ජූලි 20 - ශ්‍රී ලංකා රේගුව වෙත තත්කාලීනව ගෙවීම් කිරීම සඳහා පහසුකම් සැලසීමට, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ විශේෂිත ගනුදෙනු කේතයක් හරහා සිදු කරනු ලබන ගනුදෙනුවක උපරිම වටිනාකම වැඩි කිරීම සඳහා, 2015 අංක 01 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය ප්‍රතිස්ථාපනය කර, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව පිළිබඳ 2017 අංක 08 දරන ගෙවීම් සහ පියවීම් චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2018 ජනවාරි 18 - ගෙවීම් සේවාවන් සැලසීම සඳහා මූල්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන ජංගම අයදුම් මෘදුකාංගවලට අවම අනුකූලතා ප්‍රමිතීන් නියම කිරීම සඳහා ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම අයදුම් මෘදුකාංගයන්ට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.

- සේවා සැපයුම්කරුවන් මගින් ගෙවීම් කාඩ්පත් ගනුදෙනු අත්පත් කර ගැනීමට අදාළ කොන්දේසි නියම කිරීම සඳහා සේවා සැපයුම්කරුවන් මගින් ගෙවීම් කාඩ්පත් භාවිතා කර සිදු කරන විද්‍යුත් වාණිජ ගනුදෙනු අත්පත් කර ගැනීම සඳහා වූ විධිවිධානය නිකුත් කරන ලදී.

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

2017 ජනවාරි 17 - 2017 වසර සඳහා වන අවදානම මත පදනම් කරගත් පරීක්ෂණ සැලැස්මක් නිකුත් කරමින් එවැනි පරීක්ෂා සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2017 ජනවාරි 20 - මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන අනුකූලතාව සම්බන්ධයෙන් මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන වෙත 2017 අංක 01 දරන විධිවිධානය නිකුත් කරන ලදී.

2017 මාර්තු 30 - අංක 2015/56 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ හඳුනා ගත් සියලුම ආයතනයන්ට අදාළ වන පරිදි තම ආයතනය හරහා සිදුවන යම් ගනුදෙනුවක් නීති විරෝධී/සාපරාධී වරදකට සම්බන්ධ බවට සැක කිරීමට සාධාරණ පදනමක් පවතී නම් එය මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට බැඳී සිටින බව දැනුවත් කරන ලදී.

2017 ඔක්තෝබර් 06 - කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන සමූහාණ්ඩුව සඳහා වන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1718 ක්‍රියාත්මක කිරීම සඳහා පනවන ලද නියෝග, විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අංක 2039/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

- අංක 2039/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සමූල ඝාතන අවි ප්‍රගුණනය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1540 ක්‍රියාත්මක කිරීම සඳහා පනවන ලද නියෝග, විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.
- විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ඉහත නියෝග දෙක සඳහා නියම කළ අධිකාරිය වශයෙන් ආරක්ෂක ලේකම්වරයා පත් කරන ලදී.

2018 ජනවාරි 10 - අංක 2053/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් අවදානම් මත පදනම්ව ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සඳහා "2018 අංක 1 දරන නමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති", නමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර වෙත නිකුත් කරන ලදී.

2018 ජනවාරි 11 - මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය සඳහා මූල්‍ය ආයතන වෙත 2018 අංක 01 දරන විධිවිධානය නිකුත් කරන ලදී.

## විදේශ විනිමය කළමනාකරණය

2017 මාර්තු 07 - ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් අත්පත් කර ගැනීමේ/ඉදි කිරීමේ/සංවර්ධනය කිරීමේ/නවීකරණය කිරීමේ අරමුණ උදෙසා වෙනත් රටක ස්ථිර නේවාසික පදිංචිය සහිතව ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන් හා ශ්‍රී ලංකාවේ හා වෙනත් රටක ද්විත්ව පුරවැසිභාවය ලබා ගෙන ඇති පුද්ගලයන්හට ණය ලබා දීම පිණිස බලයලත් වෙළඳුන් වෙත අවසර ලබා දෙන ලදී.

**2017 ජුනි 23**

- ගිණුම් වර්ග කිහිපයක් සඳහා අනුමත බැරකිරීම් ලෙස, හුවමාරු සමාගම්/මධ්‍යස්ථානවලින් ලද අරමුදල් බැංකු පද්ධතිය හරහා ලද ආමුඛ ප්‍රේෂණ ලෙස සැලකීමට බලයලත් වෙළඳුන් හට අවසර ලබා දෙන ලදී.

**2017 ජූලි 05**

- දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන යටතේ නිදහස් ව්‍යාපෘතිවල (exempt projects) නියැලී සිටින වෘත්තීය සේවා සැපයුම්කරුවන් වෙනුවෙන් බදු නිදහස් කිරීම් ප්‍රදානය නොකරන හෙයින් අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් හා ඔවුන්ගේ සේවකයන් වෙනුවෙන් වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් අලුතින් විවෘත කිරීමේ හැකියාව ඉවත් කර ගන්නා බව බලයලත් වෙළඳුන් හට දැනුම් දෙන ලදී.

**2017 නොවැම්බර් 20**

- ප්‍රාග්ධන ප්‍රවාහ තවදුරටත් ලිහිල් කිරීම හා ජංගම ගිණුම් ගනුදෙනු හා විවිධ වර්ගයේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්/රුපියල් ගිණුම් ආශ්‍රිත ක්‍රියාවලීන් සරල කිරීම අරමුණු කර ගනිමින් 1953 අංක 24 දරන විනිමය පාලන පනත අවලංගු කරමින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ විදේශ විනිමය මෙහෙයුම් කටයුතු සඳහා නව නෛතික හා ප්‍රතිපත්ති රාමුවක් ක්‍රියාත්මක කරන ලදී.
- නව පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම පිණිස විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙනුවට විදේශ විනිමය දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.
- නව පනත යටතේ නිකුත් කරන ලද විධාන යටතේ වන ප්‍රධාන නියෝග/ප්‍රතිපත්තීන්හි සාරාංශයක් පහත දැක්වේ.
  - 2017 නොවැම්බර් 20 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ප්‍රකාශයට පත් කර නොමැති සහ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත හෝ (26 වන අධිකාරිය වූ) අල්ලස් පනත යටතේ අධිකරණයක දී දැනට නඩු කටයුතු පවත්වා ගෙන යනු ලබන හෝ අධිකරණයක් විසින් නියෝගයක් නිකුත් කරනු ලැබ ඇති දේපළක් නොවන යම් විදේශ විනිමය වත්කමක් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීමේදී  එ.ජ. ඩොලර් මිලියනය ඉක්මවන්නේ නම් සියයට 1 ක ප්‍රේෂණ ගාස්තුවකට යටත්ව ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීමට ශ්‍රී ලංකාවේ නේවාසික ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකු හට අවසර දෙන ලදී.
  - ශ්‍රී ලංකාවේ නේවාසිකයන් හට නව ආයෝජන අවස්ථා නිර්මාණය කරමින් ඒකක සහ ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට ද අවසර ලබා දෙමින් සුරැකුම්පත් (කොටස්) හා ස්වෛරීත්ව බැඳුම්කරවලට සීමා වී තිබූ විදේශ ආයෝජන කාණ්ඩ පුළුල් කරන ලදී.
  - ශ්‍රී ලාංකික විගමනිකයන් වෙනුවෙන් සුදුසුකම් ලත් විගමනික දීමනාව ප්‍රේෂණය කිරීම සඳහා බලයලත් වෙළඳුන් හට පොදු අවසරයක් ලබා දුන් අතර විගමනික ප්‍රේෂණ සම්බන්ධයෙන් පැවති විගමනික දීමනා සීමා ඉහළ නංවන ලදී.
  - මූල්‍ය සමාගම්හි ස්ථාවර තැන්පතු, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයක් මගින් නිකුත් කරන ලද සුරැකුම්පත් සහ ශ්‍රී ලංකාවේ සංස්ථාගත නොකළ කොළඹ සුරැකුම්පත් හුවමාරුවේ ලැයිස්තුගත කළ සමාගම්වල කොටස් ආදියෙහි සිදු කරනු ලබන ආයෝජන යනාදිය ඇතුළත් කරමින් අනේවාසිකයන් හට ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ආයෝජනයන්ට අදාළ අවකාශ පුළුල් කරන ලදී.
  - විදේශ විනිමය ගනුදෙනුවල නියැලීමේ දී පැහැදිලි බව හා පහසුව සැලසීමේ අරමුණින් සූක්ෂම මෙහෙයුම් ලක්ෂණ මත පදනම්ව විනිමය පාලන පනත යටතේ අවසර ලබා දී තිබූ ගිණුම් වර්ග 18 ක් නව විදේශ විනිමය පනත යටතේ පුද්ගල විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ආමුඛ ආයෝජන ගිණුම්, ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන රුපියල් ගිණුම් සහ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් නමින් ප්‍රධාන කාණ්ඩ 5 කට නැවත වර්ගීකරණය කරන ලදී. ඊට අමතරව, ගිණුම් අතර නිදහස් ප්‍රේෂණ සඳහා ඉඩ සලසා දෙන ලදී.

- පවතින නියෝග අන්තර්ජාතික ප්‍රමිතීන් හා ගැලපෙන බවට තහවුරු කරමින් මුළු වටිනාකම එ.ජ. ඩොලර් 15,000 හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් ඉක්මවන්නේ නම් හෝ විදේශ මුදල් නෝට්ටුවල වටිනාකම එ.ජ. ඩොලර් 10,000 හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් ඉක්මවන්නේ නම්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට ප්‍රකාශ කිරීමට යටත්ව, විදේශ විනිමය ඕනෑම ප්‍රමාණයක් රැගෙන ඒමට/යාමට ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිටත් වන පුද්ගලයන් හට අවසර ලබා දෙන ලදී. තවද එ.ජ. ඩොලර් 10,000 හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක උපරිමයකට යටත්ව විදේශ මුදල් නෝට්ටු ඕනෑම කාලයක් දක්වා තමා සන්තකයේ රඳවා තබා ගැනීම පිණිස ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික ඕනෑම පුද්ගලයෙකු හට අවසර ලබා දෙන ලදී.
- ගෝලීය ප්‍රමිතීන් අනුගමනය කරමින් හා පැහැදිලිභාවය හා විනිවිදභාවය තහවුරු කරමින්, අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ XXX(D) වගන්තිය මත පදනම්ව පුළුල් වර්ගීකරණ හතරක් යටතේ ජංගම ගනුදෙනු වර්ග කරන ලදී. ඒ අනුව, විදේශ විනිමය ගනුදෙනුවල කාර්යක්ෂමතාව ඉහළ නංවාලීම තහවුරු කරමින් ගනුදෙනුවල සද්භාවය සලකා බලා ජංගම ගනුදෙනු ක්‍රියාත්මක කිරීමේ වගකීම බලයලත් වෙළඳුන් හට පවරන ලදී.
- පෙර පැවති ණය යෝජනා ක්‍රම තුනක් ඒකාබද්ධ කරමින් විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.
- ස්ථිර නේවාසික ස්ථානය පාදක කර ගැනීම වෙනුවට ශ්‍රී ලංකාව තුළ ගත කරන ලද සමාහාර දින ගණන (එනම් දින 183) මත පදනම්ව පුද්ගලයෙකුගේ නේවාසිකභාවය තීරණය කිරීම සඳහා නව උපමානයක් හඳුන්වා දෙන ලදී.

## මිල සංශෝධන

2017 ජනවාරි 09 - භූමිතෙල් ලීටරයක සිල්ලර මිල රුපියල් 44 දක්වා රුපියල් 5 කින් අඩු කරන ලදී.

2017 ජනවාරි 27 - පහත සඳහන් අයිතම සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා අඩු කරන ලදී.

- මයිසූර් පරිප්පු (රතු පරිප්පු) කිලෝග්‍රෑමයක් රුපියල් 169 සිට රුපියල් 159 දක්වා
- වියළි හාල්මැස්සන් (ආනයනික - තායිලන්ත) කිලෝග්‍රෑමයක් රුපියල් 495 සිට රුපියල් 490 දක්වා
- වියළි හාල්මැස්සන් (ආනයනික - ඩුබායි) කිලෝග්‍රෑමයක් රුපියල් 410 සිට රුපියල් 405 දක්වා
- මුං ඇට කිලෝග්‍රෑමයක් රුපියල් 220 සිට රුපියල් 205 දක්වා
- සුදු සීනි කිලෝග්‍රෑමයක් රුපියල් 95 සිට රුපියල් 93 දක්වා
- අර්තාපල් (ආනයනික) කිලෝග්‍රෑමයක් රුපියල් 120 සිට රුපියල් 115 දක්වා

2017 පෙබරවාරි 08 - පහත සඳහන් සහල් වර්ග සඳහා උපරිම සිල්ලර මිල සීමා පනවන ලදී.

- සම්බා සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 80
- නාඩු සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 72
- කැකුළු සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 70

2017 පෙබරවාරි 17 - සහල් සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා පහත පරිදි සංශෝධනය කරන ලදී.

| සහල් වර්ගය | දේශීයව නිපදවන සහල් සඳහා උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑමයට රුපියල්) | ආනයනික සහල් සඳහා උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑමයට රුපියල්) |
|---|---|---|
| සම්බා සහල් (කීරි සහ සුදුරු සම්බා හැර) | 90 | 80 |
| නාඩු සහල් | 80 | 72 |
| කැකුළු සහල් | 78 | 70 |

| | |
|---|---|
| | - වෛද්‍ය උපකරණ සඳහා උපරිම සිල්ලර මිල සීමා පැනවීම සඳහා 2017 අංක 01 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝගය නිකුත් කරන ලදී. |
| 2017 මාර්තු 14 | - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය මත වූ උපරිම සිල්ලර මිල සීමා ඉවත් කරන ලදී.<br>- සුදු සීනි<br>- අධි ශීත කළ හෝ ශීත කළ සම සහිත හා සම රහිත බ්‍රොයිලර් කුකුළු මස් (සම්පූර්ණ කුකුළා) |
| 2017 ජූලි 01 | - මගී බස් ගාස්තු සියයට 6.28 ක ප්‍රතිශතයකින් වැඩි කරන ලදී. අවම බස් ගාස්තුව රුපියල් 9 සිට රුපියල් 10 දක්වා වැඩි කරන ලදී. |
| 2017 අගෝස්තු 16 | - සහල් සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා ඉවත් කරන ලදී. |
| 2017 අගෝස්තු 30 | - වියළි හාල්මැස්සන් (ආනයනික - තායිලන්ත සහ ඩුබායි) සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා ඉවත් කරන ලදී. |
| 2017 සැප්තැම්බර් 26 | - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්. පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,431 දක්වා රුපියල් 110 කින් වැඩි කරන ලදී. |
| 2017 නොවැම්බර් 08 | - සස්ටජන් ග්‍රෑම් 400 සඳහා වූ උපරිම සිල්ලර මිල සීමාව ඉවත් කරන ලදී. |
| 2017 දෙසැම්බර් 06 | පහත සඳහන් අයිතම සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා අඩු කරන ලදී.<br>- මයිසූර් පරිප්පු (රතු පරිප්පු) කිලෝග්‍රෑමයක් රුපියල් 159 සිට රුපියල් 130 දක්වා<br>- කට්ටා කරවල කිලෝග්‍රෑමයක් රුපියල් 1,100 සිට රුපියල් 1,000 දක්වා<br>- පොල් සඳහා ගෙඩියක් මත රුපියල් 75 ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2017 දෙසැම්බර් 26 | - නාඩු සහල් සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා පහත පරිදි සංශෝධනය කරන ලදී.<br>- දේශීයව නිපද වූ කිලෝග්‍රෑමයට රුපියල් 80 සිට රුපියල් 74 දක්වා<br>- ආනයනික කිලෝග්‍රෑමයට රුපියල් 72 සිට රුපියල් 74 දක්වා |

### බදු සංශෝධන

### පුද්ගල ආදායම් බදු

2018 අප්‍රේල් 01 - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව සිදු කරන ලද ප්‍රධාන සංශෝධන පහත දක්වා ඇත.

- පුද්ගල ආදායම් බදු සඳහා වන නිදහස රුපියල් 500,000 ලෙස පවත්වා ගන්නා ලදී.
- සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම සඳහා වාර්ෂික බදු නිදහස් දීමනාව වසරකට රුපියල් 750,000 සිට රුපියල් මිලියන 1.2 දක්වා වැඩි කරන ලදී.
- බදු කාණ්ඩ රුපියල් 500,000 සිට රුපියල් 600,000 දක්වා පුළුල් කරන ලද අතර අනුක්‍රමික බදු ව්‍යුහයන් පහත පරිදි හඳුන්වා දෙන ලදී.

| බදු අය කළ හැකි ආදායම (වර්ෂයකට) | | | |
|---|---|---|---|
| පෙර පනත | බදු අනුපාතය | නව පනත | බදු අනුපාතය |
| පළමු රු. 500,000 | 4% | පළමු රු. 600,000 | 4% |
| රු. 500,001 - රු. 1,000,000 | 8% | රු. 600,001 - රු. 1,200,000 | 8% |
| රු. 1,000,001 - රු. 1,500,000 | 12% | රු. 1,200,001 - රු. 1,800,000 | 12% |
| රු. 1,500,000 ඉක්මවන | 16% | රු. 1,800,001 - රු. 2,400,000 | 16% |
| | | රු. 2,400,001 - රු. 3,000,000 | 20% |
| | | රු. 3,000,000 ඉක්මවන | 24% |

- සියයට 10 ක අනුපාතයක් යටතේ ප්‍රාග්ධන ලාභ මත බද්ද හඳුන්වා දීම

**සංස්ථාපිත ආදායම් බදු**

2018 අප්‍රේල් 01 - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව සංස්ථාපිත ආදායම් බදු, බදු අනුප්‍රමාණ 3 කට පහත පරිදි සංශෝධනය කරන ලදී.

(අ) සියයට 14 ක අඩු බදු අනුප්‍රමාණය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, භාණ්ඩ හා සේවා අපනයන, කෘෂිකාර්මික ව්‍යවසාය සහ අධ්‍යාපන සේවාවලින් ලද ලාභ සහ ආදායම් මත අදාළ වේ.

(ආ) ඉහළ බදු අනුප්‍රමාණය වන සියයට 40, ඔට්ටු හා සූදු, මත්පැන්, දුම්කොළවලින් ලද ලාභ සහ ආදායම් සඳහා අදාළ වේ.

(ඇ) සම්මත බදු අනුප්‍රමාණය වන සියයට 28, බැංකු හා මූල්‍ය ව්‍යාපාර, රක්ෂණ, කල්බදු සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් ඇතුළුව අනෙකුත් සියලුම අංශවල ලාභ සහ ආදායම් මත අය කෙරේ.

**රඳවා ගැනීමේ බදු**

2018 අප්‍රේල් 01 - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව පහත සංශෝධන සිදු කරන ලදී.

- බැංකු තැන්පතු මත පුද්ගලයන් විසින් උපයන පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු අනුපාතිකය සියයට 2.5 සිට සියයට 5 දක්වා වැඩි කරන ලදී.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රුපියල් මිලියන 1.5 දක්වා බැංකු තැන්පතු මත උපයන පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු නිදහස් කරන ලදී.
- භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු නිදහස් කරන ලදී.
- මසකට රුපියල් 50,000 ක් ඉක්මවන සේවා ගාස්තු සහ කොන්ත්‍රාත් ගෙවීම් සඳහා රඳවා ගැනීමේ බද්දක් පනවන ලදී.

**ආර්ථික සේවා ගාස්තු**

2017 අප්‍රේල් 01 - ආර්ථික සේවා ගාස්තුවට යටත් වන පිරිවැටුමේ සීමාව කාර්තුවකට රුපියල් මිලියන 50 සිට කාර්තුවකට රුපියල් මිලියන 12.5 දක්වා අඩු කරන ලදී.

- සෑම ආනයනික මෝටර් වාහන තොගයක් සඳහාම (ආර්ථික සේවා ගාස්තුව අදාළ වන උපරිම සීමාව නොසලකා හරිමින්) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කරන ලද පිරිවැය, රක්ෂණ හා නැව් ගාස්තු අගය (CIF value) මත ආර්ථික සේවා ගාස්තු අය කරනු ලැබේ.
- ආර්ථික සේවා ගාස්තුවට යටත් නොවූ ආයතයක් වූ ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සේවා ගාස්තුවට යටත් කරන ලදී.

**එකතු කළ අගය මත බදු**

අපේක්ෂිත - සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 84.79 සහ 89.50 යටතේ වන සූර්ය සංවේදක සඳහා වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම

- පැල සහ මල් වර්ග, ප්ලාස්ටික් පබලු, නූල්/රෙදි, ඇව සහ ඇව භාණ්ඩ, ඩයි වර්ග, වීදුරු පබලු, යන්ත්‍ර, පිරියත, විදුලි උපකරණ, ගුවන්යානා අමතර කොටස්, ඇස් කණ්ණාඩි, කැමරා, ප්‍රොජෙක්ටර් සහ ඔරලෝසු මත එකතු කළ අගය මත බදු නිදහස ඉවත් කිරීම
- සහාධිපත්‍ය නිවාස (condominium) විකිණීම මත වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම

**ජාතිය ගොඩනැගීමේ බද්ද**

2017 අප්‍රේල් 01 - පහත සඳහන් භාණ්ඩ හා සේවා ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- බාහිර පිවිසුම් ක්‍රියාකරුවන් විසින් දේශීය ක්‍රියාකරුවන් වෙත ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම
- පුවත්පත් හැර මුද්‍රිත පොත්, සඟරා, ජර්නල් සහ වාර සඟරා සැපයීම
- ලංකා විදුලිබල මණ්ඩලය හැර වෙනත් ආයතනයකින් විදුලිය සැපයීම

| | |
|---|---|
| 2017 අගෝස්තු 01 | - පහත සඳහන් අයිතම මත වූ ජාතිය ගොඩනැගීමේ බදු නිදහස් කිරීම් ඉවත් කර ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් කරන ලදී. |
| | - ශ්‍රීලංකන් ගුවන් සමාගම, මිහින් ලංකා (පෞද්.) සමාගම සහ එයාර් ලංකා කේටරින් සමාගම විසින් අන්තර්ජාතික ප්‍රවාහන සේවා සැපයීම සඳහා අවශ්‍ය වන ඕනෑම භාණ්ඩයක් සැපයීම |
| | - සමූපකාර සමිති හෝ ලක් සතොස මගින් භාණ්ඩ හා සේවා සැපයීම |
| | - උප කොන්ත්‍රාත්කරුවෙකු හැර කොන්ත්‍රාත්කරුවෙකු විසින් සිදු කරන ඉදිකිරීම් සේවා |
| | - සංචාරක ඒජන්තවරයෙකු විසින් සපයනු ලබන දේශීය ගමන් සේවා (බැංකුවක් හරහා විදේශීය මුදලින් සිදුවන ගෙවීම් අදාළ වන සිදුවීම් හැර) |
| | - පදිංචිය සඳහා නිවාස සැපයීම |

### නිෂ්පාදන/සුරා බදු

| | |
|---|---|
| 2017 ජනවාරි 01 | - බෝතල් කරන ලද රා සඳහා අය කළ බද්ද ලීටරයට රුපියල් 30 සිට ලීටරයට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. |
| | - වාර්ෂික ඉස්කාගාර බලපත්‍ර ගාස්තුව (තල් අරක්කු හැර) රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 1 දක්වා අඩු කරන ලදී. |
| | - රට බීම බලපත්‍ර සමඟ නිකුත් කරනු ලබන අරක්කු බලපත්‍රයක් සඳහා රුපියල් 100,000 ක බලපත්‍ර ගාස්තුවක් පනවන ලදී. |
| | - බෝතල් රා විකිණීම සඳහා රුපියල් 50,000 ක බලපත්‍ර ගාස්තුවක් පනවන ලදී. |
| 2017 මාර්තු 13 | - විදේශීය මත්පැන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සරල කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. |
| 2017 නොවැම්බර් 10 | - පානීය නොවන ස්ප්‍රීතු තොග ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 15 ක සුරා බද්දක් පනවන ලදී. |
| | - මද්‍යසාර සඳහා වන සුරා බදු පහත පරිදි ඉහළ නංවන ලදී. |
| | - ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු මත්පැන් මද්‍යසාර ලීටරයක් සඳහා රුපියල් 1,850 සිට රුපියල් 3,300 දක්වා |
| | - ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු මත්පැන් මද්‍යසාර ලීටරයක් සඳහා රුපියල් 2,030 සිට රුපියල් 3,300 දක්වා |
| | - ධාන්‍ය මත්පැන් මද්‍යසාර ලීටරයක් සඳහා රුපියල් 160 හා රුපියල් 315 සිට (නිරපේක්ෂ සැර පිළිවෙළින් සියයට පහට අඩු සහ සියයට පහ හෝ ඊට වැඩි) රුපියල් 2,400 දක්වා |
| | - රා හෝ වෙනත් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැර වෙනත් පැලෑටියක් භාවිතයෙන් සෑදූ මද්‍යසාර ලීටරයක් සඳහා රුපියල් 1,120 සිට රුපියල් 2,400 දක්වා |
| | - එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය මත පහත පරිදි බදු පනවන ලදී. |
| | - පොල් රා තොග ලීටරයක් සඳහා රුපියල් 5 |
| | - මොලෑෂස් තොග කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 10 |
| | - සහල් පල්ප, ඉරිඟු පල්ප සහ පලතුරු පල්ප තොග කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 10 |
| 2018 ජනවාරි 01 | - වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සංශෝධනය කරන ලදී. |

### නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද

| | |
|---|---|
| 2017 අගෝස්තු 18 | - සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.04 යටතේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා මෝටර් වාහන මත වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද ඒකකයක් සඳහා රුපියල් 1,000,000 සිට රුපියල් 700,000 දක්වා අඩු කරන ලදී. |
| | - සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.11 යටතේ මෝපෙඩ් ඇතුළු මෝටර් බයිසිකල් මත වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද සංශෝධනය කරන ලදී. |

### ආනයන තීරු බදු

2017 පෙබරවාරි 01 - ඩීසල් ආනයනය සඳහා ලීටරයට රුපියල් 3 ක තීරුබදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව ඩීසල් සඳහා අදාළ තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 12 කි.

- පෙට්‍රල් ආනයනය සඳහා ලීටරයට රුපියල් 10 ක තීරුබදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව පෙට්‍රල් සඳහා අදාළ තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 25 කි.

2017 පෙබරවාරි 17 - සත්ව ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, දුනු කොළ නිෂ්පාදනය සඳහා වන වානේ දඬු සහ පොලු වර්ග සහ ප්‍රමිතියෙන් යුත් ගොඩනැගිලි තැනීම සඳහා යොදා ගන්නා වානේ මත වූ ආනයන බදු නිදහස් කරන ලදී.

- ප්‍රාථමික ස්වරූපවලින් ඇති බහු අවයවික, සෝයා බෝංචි, ටයර්, වානේ, බෝල බෙයාරිං, ස්පාක් ප්ලග් සහ බැටරි සඳහා අදාළ තීරු බදු සංශෝධනය කරන ලදී.

2017 ජූලි 08 - කිරිපිටි ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 180 සිට කිලෝග්‍රෑමයට රුපියල් 223 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව කිරිපිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 2 කි.

2017 අගෝස්තු 02 - තිරිඟු ඇට ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 3 සිට කිලෝග්‍රෑමයට රුපියල් 6 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව තිරිඟු ඇට සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 6 කි.

2017 ඔක්තෝබර් 07 - කජු මද ආනයනය සඳහා සියයට 30 ක සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ප්‍රදානය කරන ලදී.

2017 දෙසැම්බර් 15 - ඩීසල් ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 3 සිට ලීටරයට රුපියල් 6 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 9 කි.

- පෙට්‍රල් ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 25 සිට ලීටරයට රුපියල් 20 දක්වා අඩු කරන ලදී. ඒ අනුව පෙට්‍රල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 15 කි.

2017 දෙසැම්බර් 22 - ඩීසල් ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 6 සිට ලීටරයට රුපියල් 11 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 4 කි.

- පෙට්‍රල් ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 20 සිට ලීටරයට රුපියල් 23 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව පෙට්‍රල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 12 කි.

### ආනයන වටිනාකම

2017 මාර්තු 15 - ඇඟලුම් නිෂ්පාදනය හා අපනයනය කිරීමේ කර්මාන්තයේ යෙදී සිටින ව්‍යාපාර විසින් තීරුබදුවලින් නිදහස් යෝජනා ක්‍රමයක් යටතේ කොන්දේසි සහිතව ආනයනය කරන ලද යන්ත්‍ර හා උපකරණ අපහරණය කිරීමේදී රේගු වටිනාකම නිර්ණය කිරීම සඳහා ක්‍රමවේදයක් ප්‍රකාශ කරන ලදී.

2017 අගෝස්තු 14 - කොන්දේසිගත පදනම මත බදු නිදහස් කිරීමේ අනුමත යෝජනා ක්‍රමය යටතේ 2015 නොවැම්බර් 19 දින හෝ එදිනට පෙර ආනයනය කරන ලද හා ලියාපදිංචි කරන ලද මෝටර් වාහන අපහරණය සඳහා රේගු වටිනාකම නිර්ණය කිරීමේ නියෝග නිකුත් කරන ලදී.

### සෙස් බද්ද

2017 අගෝස්තු 02 - තිරිඟු පිටි ආනයනය සඳහා අය කළ සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා අඩු කරන ලදී.

2017 නොවැම්බර් 27 - හඳුනාගත් අයිතම 253 ක් සඳහා වූ සෙස් බද්ද ඉවත් කරන ලදී.

## විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

| | |
|---|---|
| 2017 ජනවාරි 07 | - සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 ජනවාරි 19 | - උම්බලකඩ, වියළි හාල්මැස්සන්, උඳු, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.<br>- එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් අඩු කරන ලදී. |
| 2017 ජනවාරි 28 | - සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මත දින 30 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 10 ක් වූ බදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද  කිලෝග්‍රෑමයට රුපියල් 5 කි. |
| 2017 පෙබරවාරි 17 | - අර්තාපල් සහ බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.<br>- රතු සහ කහ පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට වැඩි  කරන ලදී.<br>- සම්පූර්ණ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා<br>- පියලි කළ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා |
| 2017 පෙබරවාරි 24 | - එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් අඩු කරන ලදී. |
| 2017 පෙබරවාරි 27 | - සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බදු අත්හැරීම දින 30 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. ඒ අනුව අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 5 කි. |
| 2017 මාර්තු 08 | - මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි, කුරක්කන් සහ ස්ඵටිකකෘත සුදු සීනි හැර සීනි සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 මාර්තු 28 | - සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මත ප්‍රදානය කළ කිලෝග්‍රෑමයකට රුපියල් 10 ක් වූ බදු අත්හැරීම 2017 මාර්තු 31 දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද  කිලෝග්‍රෑමයට රුපියල් 5 කි. |
| 2017 අප්‍රේල් 01 | - සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 60 ක කාලපරිච්ඡේදයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී. |
| 2017 අප්‍රේල් 02 | - කරවල, යෝගට්, වෙඬරු, කිරිවලින් නිපදවූ තැවරුම්, සුදු ළූණු, අලුත් දොඩම්, මිදි, ඇපල්, උළුහාල් ඇට, කුරක්කන් පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට සහ ලුණු ආනයන සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 මැයි 08 | - ශීර්ෂයේ කටු ගැලවූ මසුන් හැර අලුත් හෝ ශීත කළ මසුන්, මුංඇට, මැංගුස්ටින් (අලුත් සහ වියළි), දොඩම් (වියළි), පෙයාර්ස්, චෙරීස්, ප්ලම්ස් සහ ස්ලෝස්, කිවි ෆෲට් සහ සංයෝජිත වර්ගීකරණ අංක 0810.90.90 යටතේ වන අනෙකුත් අලුත් පළතුරු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 මැයි 21 | - රතු ළූණු, රට ඉඳි, මිදි (වියළි), සූදුරු බීජ සහ මහදුරු බීජ ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

| | |
|---|---|
| | - පොතු සහිත (දුඹුරු) සහල් ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 මැයි 31 | - සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017 අගෝස්තු 31 දක්වා දීර්ඝ කරන ලදී. |
| 2017 ජූනි 06 | - මාගරින් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 කින් වැඩි කරන ලදී. |
| 2017 ජූනි 07 | - මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මත දින 30 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 25 ක් වූ බදු අත්හැරීමක් ප්‍රදානය කරන ලදී. ඒ අනුව අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද  සියයට 10 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 50 කි. |
| 2017 ජූලි 01 | - කැඩුණු සහල් ආනයනය සඳහා මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 ජූලි 19 | - උම්බලකඩ, වියළි හාල්මැස්සන්, උඳු, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 ජූලි 27 | - සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017 දෙසැම්බර් 31 දක්වා කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට ශත 25 දක්වා අඩු කරන ලදී. |
| 2017 අගෝස්තු 01 | - තලපත් සහ කොප්පරා මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 75 හෝ සියයට 10 යන දෙකෙන් වැඩි අගයේ සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා අඩු කරන ලදී. |
| | - තිරිඟු ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 අගෝස්තු 02 | - කැඩුණු සහල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017 දෙසැම්බර් 31 දක්වා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට ශත 25 දක්වා අඩු කරන ලදී. |
| 2017 අගෝස්තු 16 | - සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 8 කින් වැඩි කරන ලදී. |
| 2017 අගෝස්තු 17 | - අර්තාපල්, බොම්බයි ළූණු සහ රතු හා  කහ පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 අගෝස්තු 24 | - එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 සැප්තැම්බර් 08 | - මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි සහ කුරක්කන් සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 ඔක්තෝබර් 02 | - කරවල, යෝගට්, වෙඩරු, කිරිවලින් නිපදවූ තැවරුම්, සුදු ළූණු, අලුත් දොඩම්, මිදි, ඇපල්, උළුහාල් ඇට, කුරක්කන් පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට සහ ලුණු ආනයන සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 නොවැම්බර් 01 | - තලපත් සහ කොප්පරා මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 25  සිට කිලෝග්‍රෑමයට රුපියල් 75 හෝ සියයට 10 යන දෙකෙන් වැඩි අගය දක්වා ඉහළ නංවන ලදී. |
| 2017 නොවැම්බර් 08 | - තලපත් සහ කොප්පරා සහ ශීර්ෂයේ කටු ගැලවූ මසුන් හැර අලුත් හෝ ශීත කළ මසුන් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 50 සිට සියයට 10 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 100 යන දෙකෙන් වැඩි අගය දක්වා ඉහළ නංවන ලදී. |

- මුංඇට, මැංගුස්ටින් (අලුත් සහ වියළි), දොඩම් (වියළි), පෙයාර්ස්, චෙරීස්, ප්ලම්ස් සහ ස්ලෝස්, කිවි ෆෲට් සහ සංයෝජිත වර්ගීකරණ අංක 0810.90.90 යටතේ වන අනෙකුත් අලුත් පලතුරු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.

2017 නොවැම්බර් 09

- පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී.
  - වියලූ, ලුණු නොදැමූ හාල්මැස්සන් කිලෝග්‍රෑමයක් රුපියල් 11 සිට රුපියල් 1 දක්වා
  - කරවල කිලෝග්‍රෑමයක් රුපියල් 102 සිට රුපියල් 52 දක්වා
  - අර්තාපල් කිලෝග්‍රෑමයක් රුපියල් 40 සිට රුපියල් 1 දක්වා
  - බොම්බයි ළූණු කිලෝග්‍රෑමයක් රුපියල් 40 සිට රුපියල් 1 දක්වා
  - පරිප්පු (සම්පූර්ණ) කිලෝග්‍රෑමයක් රුපියල් 10 සිට රුපියල් 1 දක්වා
  - පරිප්පු (පියලි කළ) කිලෝග්‍රෑමයක් රුපියල් 15 සිට රුපියල් 3 දක්වා
- එළවළු තෙල් ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී.

2017 නොවැම්බර් 21

- රතු ළූණු, රට ඉඳි (අලුත් සහ වියළි), මිදි (වියළි), සූදුරු බීජ, මහදුරු බීජ සහ මාගරින් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.

2017 දෙසැම්බර් 14

- තලපත්, කොප්පරා සහ තෝර මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 75 හෝ සියයට 10 යන දෙකෙන් වැඩි අගයේ සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා අඩු කරන ලදී.
- පොල් මද ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 1 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී.

2017 දෙසැම්බර් 15

- එළවළු තෙල් ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී.

2018 ජනවාරි 01

- සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට ශත 25 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2018 මාර්තු 31 දක්වා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.

2018 ජනවාරි 19

- උම්බලකඩ, උඳු, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.
- සියලුම වර්ගවල පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 200 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී.

2018 පෙබරවාරි 01

- තිරිඟු ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.

2018 පෙබරවාරි 16

- සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.

2018 පෙබරවාරි 24

- අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2018 මාර්තු 31 දක්වා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 1 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී.

2018 මාර්තු 08

- මැකරල් (මාළු), මැ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි සහ කුරක්කන් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.

### වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

2017 නොවැම්බර් 10 - හඳුනා ගත් අයිතම 950 ක් සඳහා වූ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද ඉවත් කරන ලදී.

### මුද්දර ගාස්තු

2017 පෙබරවාරි 21 - යම් රක්ෂණ ඔප්පුවක්, මූල්‍ය කල්බදු ගිවිසුමක් සහ කුලී සින්නක්කර ගිවිසුමක් සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ගෙවිය යුතු මෝටර් වාහන වර්ග වෙන් කර දක්වන ලදී.

### නැව් නැගීමේ/ගුවන්ගත වීමේ බදු

2017 ජනවාරි 01 - නැව් නැගීමේ/ගුවන්ගත වීමේ බද්ද එ.ජ. ඩොලර් 30 සිට එ.ජ. ඩොලර් 50 දක්වා වැඩි කරන ලදී.

### අනෙකුත්

2017 සැප්තැම්බර් 01 - අන්තර්ජාල සේවාවන් මත වූ විදුලි සංදේශ බද්ද ඉවත් කරන ලදී.

2017 නොවැම්බර් 08 - ටෙලිනාට්‍ය, චිත්‍රපටි සහ වාණිජ වැඩසටහන් සඳහා ගෙවිය යුතු ටෙලිනාට්‍ය චිත්‍රපටි සහ වාණිජ වැඩසටහන් බද්ද වැඩි කරන ලදී.

අපේක්ෂිත - සිම් කාඩ් මත රුපියල් 200 ක සක්‍රිය කිරීමේ ගාස්තුවක් පැනවීම

- විද්‍යුත් මෝටර් රථ හා ට්‍රැක්ටර් හැර අනෙකුත් වාහන මත කාබන් බද්දක් පැනවීම

### රාජ්‍ය වියදම

2017 මාර්තු 08 - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවුරුදු 61 දක්වා දීර්ඝ කරමින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2017 නිකුත් කරන ලදී.

2017 ජූනි 09 - ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට සහ ඔවුන්ගේ වැන්දඹුවන් හට “රණවිරු සුරැකුම් දීමනාව” 2017 ජනවාරි 01 දින සිට හිමිගැන්වීමට තීරණය කරමින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2017 නිකුත් කරන ලදී.

### රාජ්‍ය ණය කළමනාකරණය

2017 ජනවාරි 10 - 2017 වර්ෂය සඳහා එ.ජ. ඩොලර් මිලියන 1,500 ක සීමාවක් දක්වා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2017 අප්‍රේල් 24 - බ්ලූම්බර්ග් වෙළඳ පද්ධතිය (ස්ථාවර ආදායම් මිල ගණන් දැක්වීමේ පිටුව) පහත සඳහන් කාර්යයන් සඳහා යොදා ගැනීමට නියම කරමින් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

- ප්‍රතිමිලදීගැනුම් අනුපාත, කාලසීමා සහ ප්‍රමාණය ඉදිරිපත් කිරීම
- රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි අලෙවිකරුවන් අතර සිදුවන සෘජු නොවන වෙනත් සියලුම ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනුවල එළඹ අනුපාත, කාලසීමාවන් සහ ප්‍රමාණය මිනිත්තු 30 ක් ඇතුළත වාර්තා කිරීම
- සියලුම අන්තර් සහභාගිත්ව ගනුදෙනු වාර්තා කිරීම

2017 මැයි 08 - 2017 වර්ෂය සඳහා එ.ජ. ඩොලර් මිලියන 3,000 ක සීමාවක් දක්වා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2017 ජූලි 27 - භාණ්ඩාගාර බැඳුම්කර සඳහා නව ප්‍රාථමික නිකුතු ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතිය යටතේ මාසිකව භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි පවත්වනු ලැබේ. මෙම පද්ධතිය යටතේ, සෑම භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවක් සඳහාම සම්මත අදියර තුනක් ඇත.

අදියර I - සාධාරණ වෙළඳපොළ මිල ගණන් ඔස්සේ තරගකාරී බහුවිධ මිල වෙන්දේසි ක්‍රමයක් තුළ නිවේදනය කරන ලද සම්පූර්ණ වටිනාකම නිකුත් කිරීම

අදියර II - වටිනාකම මත පදනම් වූ ස්වේච්ඡා මිල කැඳවීම් සඳහා විවෘත කිරීම

| | | | |
|---|---|---|---|
| | අදියර III | - | පළමු සහ දෙවන අදියර යටතේ අපේක්ෂිත මුදල් ප්‍රමාණයට වඩා අඩුවෙන් එක්රැස් කර ඇති අවස්ථාවක අනිවාර්යය පදනමක් මත අදියර I දී ඉදිරිපත් කරන ලද ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට 60 ක් පිළිගැනීම මත පදනම් වෙමින් ප්‍රාථමික වෙළඳුන් හට නිකුත් කිරීම |
| 2017 දෙසැම්බර් 14 | - | 2018 වර්ෂය සඳහා එ.ජ. ඩොලර් මිලියන 2,500 ක සීමාවක් දක්වා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. | |